# සමරු කලාපය

# 2018 ස්රප්ජනී

## යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා

## සන්නිවේදන හා මහජන සබඳතා උළෙල

mass.comm
DEPARTMENT OF MASS COMMUNICATION

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# ජනප්‍රිය සංස්කෘතිය හා මාධ්‍ය භාවිතය - ප්‍රතිවේද කිහිපයක්

සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

ජනප්‍රිය සංස්කෘතිය යන සන්නිවේදන සංකල්පය භාෂාව නිර්මාණය සමාජ විපරිණාමය යන සාධක රැසක් මත රැඳී පවතී. ඉතා සරල අර්ථයකින් ද මෙකල මේ සංකල්පය විවිධ කෝණයන්හි පිහිටා අධ්‍යයනය කරනු පෙනේ. ඒ සම්බන්ධයෙන් පනහේ දශකයේ අග භාගයේ දී කරන ලද පර්යේෂණවල ඉම කෙමෙන් පුළුල් වී ගොස් ජනප්‍රිය සංස්කෘතිය යන්නට නව සංකල්ප රැසක් මුසු වී පවතී. නිදසුනක් වශයෙන් ගත් කල බෙහෙවින් සමාජයක ජනප්‍රියත්වයට පත් වී පවතින සංගීත නිර්මාණයක් අතීතයේ දී ගැයුණු ජන ගීයක විකාශයක් ලෙස පෙන්වා දී ඇත. ඒ විපරිණාමය සමාජය තුළින් මතු ව ආ තාක්ෂණයේ ම ප්‍රතිඵලයක් වශයෙන් ද සැලකිය හැකි යැයි පැවසේ. එබැවින් සංගීතය පිළිබඳ පර්යේෂණ සමුදායකට මානව නාද රටා පමණක් නොව තාක්ෂණ විධික්‍රම ද මුසුව ජනප්‍රිය යන්නට නව අරුත් සැපයේ. මේ නිදසුන අතු ඉති විහිදී යාම හෝ එක් තැනක රැඳී පැවතීම ඒ ඒ සමාජයන් හී පවතින රුචිකත්වය අනුව රැඳී ඇත.

මේ ස්වාභාවය ගීතයේ වෙනස්වීමට අනුකූල ව සිදු වූවක් වශයෙන් ද පෙන්විය හැකි ය. පැරණිතම ගීයක පද සංකල්පය වෙනස් කොට නවතම අදහසක් බිහි වීම සඳහා නිර්මාණයක් කළ හැකි නම් එම නිර්මාණයේ සමස්ත අර්ථය කොතරම් දුරට ජනතාව (රසික කැල) විසින් පිළිගනු ලබන්නේ ද යන්න මත රැඳී පවතී. මේ සංසිද්ධිය විටෙක ඒක පුද්ගල ප්‍රයත්නයක් වශයෙන් ද ඒක පුද්ගල සමාජගත වන නිදසුනක් සහිත ව පෙන්වා දිය හැකි ය. මේ සඳහා ගතහැකි වඩා යහපත් නිදසුන වන්නේ කණ්ඩායම් සංගීතයයි.

නවතම ජනප්‍රිය සංගීත කණ්ඩායමක් (pop music group) අතරත් ඈත අතීතයේ පැවති ගායන වෘන්දයක් අතරත් බාහිරෙන් පෙනෙන වෙනස්කම් රැසක් පවතිය හැකිය. එහෙත් මේ දෙකෙහි සංකලනයක් වන අවස්ථා ද විටින් විට දිස්විය හැකි ය. මේ හා සමාන ව ම රංග කලාවේ සංගීතය, පෙළ හා නර්තනය ද විපරිණාමයන්ට කලින් කල ගොදුරු වේ. ඈත අතීතයේ ග්‍රීසියේ රඟ දක්වන ලද

ඊස්කිලස්ගේ පොමිතියස් බන්ධනය නවතම රංග සංකල්පයන්ට අනුව සමාජගත රුචිකත්වයන්ට අනුකූල ව වෙනස්විය හැකි ය. මේ තත්ත්වය වටහා ගැනීමට නම් තුලනාත්මක රංග අධ්‍යයනයන්ට නැඹුරු විය යුතු ය.

සම්මත රුචිකත්වය හා සමාජගත අවශ්‍යතාවය ද ජනප්‍රිය යනුවෙන් හැඳින්වෙන සංකල්ප කලින් කලට විපරිණාමයන්ට හසුවන්නකි. යුද්ධයක් පවතින රටක පවතින සමාජගත දැක්මත් එසේ නොපවතින රටක වෙසෙන ජනයාගේ සමාජගත දැක්මත් අතර පරතරයක් පවතී.

යුද කෝලාහලවලට මැදිව ජනතාව විසින් බිහි කරන ලද (නොමැතිනම් ඔවුන්ගෙන් ආකාස්මිකව බිහි වූ) නිර්මාණයක් හා එසේ නොවූ සංක්ෂේප වශයෙන් සන්සුන්කමින් යුතු පරිසරයක වෙසෙන ජනතාවගේන් බිහි වූ නිර්මාණයක් අතරත් පරතරයක් පවතී. ඒ සඳහා වඩාත් ම ප්‍රබල නිර්මාණ සමුදායක් දැක ගත හැක්කේ ජනශ්‍රැතියෙනි. ජනශ්‍රැතියේ එන ජන ගීත, ජන කවි, ජන කියමන්වල මේ පදනම මැනවින් රැඳී පවතී.

මේ සමාජ තන්ත්‍ර දෙකෙහි බිහිවුණු 'ප්‍රේම ගීත' විරහා ගීත' 'සටහන් ගීත' තුලනාත්මක අවබෝධ කටයුතු ය. ඒ කෙරෙහි ජනයා දක්වන ලැදිකම හා අපේක්ෂාව ගවේෂණය කළ යුතු ය. එක් ප්‍රේම ගීතයක ඇත්තේ හුදු පෞද්ගලික චින්තාවලියක් විය හැකි ය. අනෙකෙහි ඇත්තේ පොදු චින්තාවලියක් විය හැකි ය. මේ හේතුවෙන් නිර්මාණාත්මක චින්තනය (Creative thinking) කෙරෙහි දැඩි ලෙස බලපාන්නේ කිසියම් සමාජ අවස්ථාවක් බව වටහා ගත යුතු ය. නිර්මණාත්මක චින්තනය, කිසියම් ඇණවුමක් හික්ම වූ පෞද්ගලික අවශ්‍යතාවයක් මත ද රැඳී පවතින බව එකී නිර්මාණ තුලනය කිරීමෙන් වටහා ගත හැකි ය. මීට සම්මත වශයෙන් දී ඇත්තේ දෘෂ්ටිය (Vision) හෝ දැක්ම (point of view) යනාදී යෙදුම් කිහිපයකි. මෙහි ම සම්මතයේ පවතින දෘෂ්ටීන් හා දැක්ම ප්‍රාචීනවාදී (Occidental) යනුවෙන් ද ප්‍රභේද කොට ඇත්තේ ය. එහෙත් මේ පිළිබඳ ව පවතින මත සමුදායේ ක්‍රමික වෙනස්කම් රැසක් මතු වේ.

ප්‍රාචීනවාදී ජනප්‍රිය සංස්කෘතිය හා ප්‍රාචීනවාදී ජනප්‍රිය සංස්කෘත යනුවෙන් වර්ග කළ හැකි බෙහෙවින් පුළුල් වූ සම්ප්‍රදායන් දෙකක් ද ගෙන හැර දැක්විය හැකි ය. ජනමාධ්‍යයන්ගේ ව්‍යාප්තිය හා අන්තර් සංස්කෘතික අධ්‍යයනය පුළුල් වීම හේතුවෙන් මේ සම්ප්‍රදායන් දෙකෙහි පවතින පරතරය ද කෙමෙන් සමීප වන බවක් ද පෙන්නුම් කළ හැකි ය. මෙය බලයෙන් හෝ ඇණවුමකින් තොර විටෙක සිදුවන අතර රාෂ්ට සම්මුතීන්ට (Stata Convention) අනුකූලව ද සිදු වන බව දැක්වේ.

කිසියම් සමාජ සිද්ධියක් පදනම් කොටගෙන සමුදායක එකඟත්වය හෝ විරෝධය මෙම සම්මුතීන්ගෙන් සිදු වන්නෙකි. අප සමීප ව හඳුනන පොදු රාජ්‍ය මණ්ඩලීය සාහිත්‍ය නිර්මාණ යන්න හෝ 'සාක් රටවල සාහිත්‍ය නිර්මාණ' හෝ 'ආසියා අප්‍රිකා නිර්මාණ සම්ප්‍රදාය' යන යෙදුම් පිටුපස පවතින දැක්ම විවරණය කිරීමෙන් මේ වග මැනවින් හඳුනා ගත හැකි ය. මෑත කාලයේ දී බිහිවූවක් වුව ද එය සම්මුතියක් හඳුනාගත හැකි වේ. එනම් කෙනෙකු ජන්ම ලාභය ලද රටින් වෙන් වී ගොස් ප්‍රමාණවත් කාලයක් පිටරට සිට පෙරළා සිය රටට පැමිණි පසුව දැනෙන 'ආගන්තුකභාවය (alienation) හෝ දුරස් වීම හඳුන්වන හයිබ්‍රිඩයිසේෂන්' යනුවෙනි. මෙය කිසිවෙකුගේ පෞද්ගලික දෝෂයක් නොව, උද්ගතව පවතින තත්ත්වයක් වශයෙන් විවරණය කොට ඇත. කාලයක් මුළුල්ලේ ම තමන් ජන්මය ලද දේශයේ ම ජීවත්වෙමින් සිටින කෙනෙකුට යට කී ආගන්තුකභාවය ඒ පුද්ගලයාගේ නිර්මාණ තුළින්

දිස්වනු ඇත. එබැවින් එක් අයෙකුට අනෙකාට දොස් පැවරිය හැකි අවකාශයක් නොමැත. කළ යුත්තේ එකිනෙකාගේ 'දෘෂ්ටීන්' හඳුනා ගැනීමකි. පළමුවැන්නා දෙවැන්නාට ආගන්තුක විය හැකි ය. දෙවැන්නා තමන් ජන්මලාභය ලද දේශයට පමණක් මුල් ඇදුණු කෙනෙකු වීමට බැරි කමක් නැත. එහෙත් දෙවැන්නාගේ චින්තනය වෙනස් කිරීමට පළමු වැන්නාට බැරිකමක් ද නැත. මේ අන්තර් සම්බන්ධතාව පිළිබඳ අවබෝධයකට මුලපිරිය යුතු ය. එසේ නොමැති වූ විට පවතින්නේ පරතරයකි, හිදැසකි. එය සන්නිවේදන හිදැසක් (communication gap) බවට පත් වේ. ඒ පරතරය හෙවත් හිදැස ක්‍රමයෙන් තුනී කිරීමට සාකච්ඡා, වාද විවාද, කතිකා, ඵලදායක ප්‍රයත්නයක් වනු නිසැක ය. එබඳු අවස්ථාවන්හි දී කෙනෙකු තුළ සම්මත ව පැවති ඇතැම් සමාජගත දෘෂ්ටියක් හෝ දැක්මක් ක්‍රමයෙන් වෙනස් වන අයුරු ද අප වටහා ගත යුතු ය.

තව ද අතිරේක ඵලයක් වනුයේ අසම්මත ගණයේ කණ්ඩායම් සමූහයක් හා ගුරුකුලයන් බිහි වීම ය. මෙය වැළැක්විය නොහැක. එසේ ක්‍රමයෙන් දියත් වූ සම්මතයට පිටු පෑ හෝ නව දෘෂ්ටීන් සමුදායක් පෙල ගැස්විය හැකි ය. ඒ හැමෙකක්ම යටින් වෙනත් නිර්මාණාත්මක චින්තනයක් ඇත. සම්මත ලිංගිකත්වය පිළිබඳව මත, සම්මත ස්ත්‍රීයත්වය පිළිබඳව මත, සම්මත පවුල් සම්බන්ධතාවය පිළිබඳව මත, සම්මත විවාහය පිළිබඳ ව මත ක්‍රමයෙන් වෙනස් වීම අනුව යට කී නිර්මාණාත්මක චින්තනයේ පරිණාමය දැකිය හැකි ය. එහෙත් මෙතැනදී කෙනෙකු විසින් වාදකරනු ඇත්තේ හෝ විටෙක විරෝධයපෑම් එල්ල කරනු ඇත්තේ හෝ යටකී තලයේ හෝ දිස්වෙන විපරිණාම ධර්මය නොවේ. ඒ වෙනුවට ඒ විපරිණාමය පදනම් කොට ගෙන බිහි වූ ඵලයයි. මේ ඵලය සම්මතයට අනුව නම් එක්කෝ 'සන්ත්‍රාසය බහුල' විය හැකි ය. එක්කෝ 'නොමනා විරෝධාකල්පයක්' විය හැකි ය. ඒ කිසිවක් නොවෙතත් 'අපට නොගැළපෙන' යන්නෙන් කියවෙන අර්ථයකින් හෙබි වීමක් විය හැකි ය. එසේ වූ අවස්ථාවන් හී දි 'ජනප්‍රිය සංස්කෘතිය' යන සංකල්පය ද ඊට මුසු වී පවතී. ඒ කෙසේ ද යත්, බොහෝ දෙනෙකු විසින් තාවකාලික වශයෙන් හෝ වැළඳ ගන්නා විපරිණාමයකට අසු වූ ධර්මයක් සමාජ විෂමතාව ලෙස පෙනී යාමයි. ඒ අනුව පවතින තත්ත්වයකට ඉඳුරා පටහැනි තත්ත්වයක් උද්ගත වීමට නිර්මාණ මගින් බලපෑම් කෙරෙනු දිස්වේ. බොලිවුඩ් චිත්‍රපට නමින් හැඳින්වෙන ජනප්‍රිය හින්දි චිත්‍රපටවල ආකෘතිය හා අන්තර්ගතය මීට ගත හැකි නිදසුනකි. දේශීය ටෙලිවිෂන් නාලිකාවන් පෙන්වන ලද ජනප්‍රිය හින්දි චිත්‍රපටවලට සම්මත චින්තනය හරස් වූයේ මේ නියාම ධර්මය පසුබිම් කොට ගෙන ය. ඒ එක් පැත්තකි. තවත් පැත්තක් නම් මේ නියාම ධර්මයට මුසු වූ වාණිජ බලවේගයයි.

'වාණිජ බලවේගය' යන්න වෙනුවට 'වාණිජ රැල්ල' යැයි ඇතැම් තැනක භාවිතයේ පවතී. කෙසේ, නම් කරනු ලැබුව ද සිදුවන්නේ කෘත්‍රිම හෙවත් තනන ලද තත්ත්වයක් පසුබිමේ වෙළඳ ව්‍යාපාරයක් දියත් වීමකි. එය විටෙක ගොරහැඩි ය. නුවණ නොසියුම් ය. බියකරු ය. මේ සාධක සන්නිවේදන පර්යේෂණ මගින් හඳුනාගනු විනා ඕනෑවට එපාවට සිදු කරන වදන් නොවැළැක්විය යුතු ය.

මේ අතරවාරයේ මෙසේ ජනප්‍රිය සංස්කෘතියක් ගොඩ නැඟුණ පසුබිමෙන් ම දේශීය වශයෙන් අනුකරණාත්මක නිර්මාණ චින්තනයක් ගොඩ නැඟීම ද දිස්වේ. මේ තත්ත්වය මෙකල බොහෝ රූපවාහිනී නාලිකාවල දිස්වෙන 'ටෙලි නාට්‍ය' නැරඹීමෙන් වටහා ගැනීමට අපහසු නොවේ.

'බොහෝ දෙනෙකුගේ හිතසුව පිණිස' යන ධර්මය වෙනුවට 'සුළු පිරිසකගේ පාලනයෙන් බහුතරයක් වෙත පිරිනැමෙන' ධර්මයක් වශයෙන් එම පෙළඹීම ප්‍රභේද කිරීමට කිසිදු බාධාවක් නොමැත. "මේ

ටෙලිනාට්‍ය මේ වෙළඳ සමාගම් අනුග්‍රයෙන් දර්ශනය වේ" යන්න තීන්දුකරන්නෝ අතලොස්සක් බඳු පිරිසකි. ඒ අතලොස්ස වුව ද බහුතරයකගේ නියෝජනයක් වශයෙන් ද සැලකීම දුෂ්කර ය. එතැන ඇත්තේ වාණිජ අරමුණු පමණි. ඒ අරමුණු ඉෂ්ට වීම යනු භාණ්ඩයක් හෝ ව්‍යාපාරික සංකල්ප ලෙස සැලකෙන බැංකු ක්‍රමයත්, රක්ෂණ ක්‍රමයත්, විෂනාශක ද්‍රව්‍ය විකිණීම හෝ එහි සමාන ප්‍රවර්ධනයත් වශයෙන් සැලකිය හැකි ය. මෙයට ඇමරිකාවේ කලක් මුළුල්ලේ ම භාවිත වූයේ 'සබන් නාට්‍ය' හෙවත් සබන් වර්ග විකිණීම සඳහා පෙන්වනු ලැබූ නාට්‍ය මාලා ලෙස සැලකුණු සෝප් ඔපෙරා යන්නයි. සබන් නාට්‍ය සම්පාදනය ක්ෂණික සිදුවීම් සමුදායකි. ලහි ලහියේ ලියා ගනු ලබන නාට්‍ය පෙළක් එක් අයෙකු විසින් හෝ ඇණවුම් කරන ලද පිරිසකට වාරානුකූලව ලියා ගැනීමක් ද සිදු වේ. ඉන්පසු ඒවායේ සුලභ අන්තර්ගතය රූපණය කළ හැකි නළු නිළියන් සමුදායක් ද අවශ්‍ය වේ. ජනප්‍රිය අංගෝපාංග සමුදායකින් සුසැදි මේ නිර්මාණ සමුදාය සුළු පිරිසක් විසින් බහුතරයකට දියත් කරනු ලබන හෝ බලයෙන් නෙරපනු ලබන්නෙකි. ඊට කුඩා තිරයෙන් නතුවන ගෘහ ජනයා තාවකාලික සුවයක් ලැබ කෙමෙන් මනෝමෝහනයකට පත්වීම සිදු වේ. එබැවින්ම ජනප්‍රිය සංස්කෘතිය විටෙක විද්වතුන් විසින් හඳුන්වනු ලැබුවේ 'මනෝමෝහන සංස්කෘතිය' යනුවෙනි. මින් මිදීමට නොහැකි වූවෝ ඊට ඇලී ගැලී වෙසෙති. ඔවුනට ඒවා මත් බෙහෙත් ගන්නා සේ ය. එහෙත් ඉන් මිදීමට වෑයම් කරන්නෝ ද වෙති. ඔවුන් සතුව පවතින්නේ විචක්ෂණයයි. (discrimination) මේ වූ කලී දීර්ඝ වශයෙන් විවරණය කළ යුතු නිර්මාණාත්මක සන්නිවේදන සංකල්පයකි.